# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | දුරකථන / தொலைபேசி / Telephone | +94 11 2484600<br>+94 11 2484700 | |
| | ෆැක්ස් / பெக்ஸ் / Fax | +94 11 2484970<br>+94 11 2320042 | |
| | වෙබ් අඩවිය / இணையதளம் / Website | www.treasury.gov.lk | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | TO/CFM/01/05/04 | ඔබේ අංකය / உமது இல / Your Number | |
| දිනය / திகதி / Date | 2021.11. 05 | | |

භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක - 06/2020

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**2021 මූල්‍ය වර්ෂය අවසානයේ මුදල් පොත් පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම**

මවිසින් නිකුත් කරන ලද 2020.10.14 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් උපදෙස් පරිදි 2021 වර්ෂය අවසානයේ මුදල් පොත් පියවීම සහ අග්‍රිම ගිණුම් පියවීම සඳහා මෙහි පහත දක්වා ඇති දින වකවානු උපයෝගී කර ගෙන , එම නිශ්චිත දිනට හෝ එදිනට පෙර අදාල කටයුතු සංවිධානය කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

1. **2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් පියවීම**

2021 වර්ෂයේ මුදල් පොත්, 2021 දෙසැම්බර් 31 දිනය අවසානයේ දී භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06 හි 1 වන ඡේදයේ සඳහන් ආකාරයට පියවිය යුතුය.

2. **2021 වර්ෂය සඳහා වූ අක්මුදල් ගිණුම (7002) පියවීම සඳහා වර්ෂය අවසානයේ මුදල් පොතේ ශේෂය මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම ( මාර්ගෝපදේශ අංක 06 හි 2 වන ඡේදය)**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් වල ශේෂය සඳහන් කරමින් ටීඕඩී/අයිඑම්පී/06 අංක දරණ ආකෘතිය සම්පූර්ණ කර , උප කාර්යාල රහිත අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2022 ජනවාරි 03 දින ද උප කාර්යාල සහිත අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2022 ජනවාරි 07 දින හෝ එදිනට පෙර ඔබගේ නිල බැංකු ගිණුම පවත්වා ගෙන යනු ලබන බැංකු ශාඛාවට භාර දී අදාල මුදල මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. බැංකුවෙන් ඔබ වෙත ලැබෙන "හර" නිවේදනය ලද වහාම එහි සහතික කරන ලද පිටපතක් සමඟ ටීඕඩී/අයිඑම්පී/06 අංක දරණ ආකෘතියෙහි පිටපත ද මෙම දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

2021 වර්ෂය තුළ දී උප කාර්යාල වෙත ලබා දී ඇති සියළුම අතුරු අග්‍රිම සහ නිලධාරීන් වෙත ලබා දී ඇති අනිකුත් අග්‍රිම ද , 2021.12.31 දිනට හෝ එදිනට පෙර පියවා එම මුදල් ශේෂයන් 2022 ජනවාරි 07 වන දින හෝ එදිනට පෙර මහ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට හැකි වන පරිදි ඔබ විසින් අවශ්‍ය පූර්ණ විධි විධාන යොදා ගත යුතු වේ.

3. **2021 වර්ෂය සඳහා වූ ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර අක් මුදල් ගිණුම (7003) පියවීම සඳහා වර්ෂය අවසානයේ මුදල් පොතේ ශේෂය මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම (මාර්ගෝපදේශ අංක 06 හි 3 වන ඡේදය)**

ප්‍රතිපූරණය කරනු ලබන විදේශාධාර සඳහා 7003 සංකේත අංකය යටතේ , ව්‍යාපෘති විසින් ලබා ගත් අග්‍රිමයෙන් ,2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය තහවුරු කරමින් ආකෘති අංක ටීඕඩී/අයිඑම්පී/07 නිසි පරිදි සම්පූර්ණ කර 2022 ජනවාරි 03 දින ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාවට භාර දී අදාල මුදල මහ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු අතර බැංකුවෙන් ඔබ වෙත ලැබෙන "හර" නිවේදනයේ සහතික කරන ලද පිටපතක්ද

සමඟ ආකෘති අංක: ටීඕඩී/අයිඑම්පී/07 සහ ටීඕඩී/අයිඑම්පී/07(i) නිවැරදිව සම්පූර්ණ කර අදාල අමාත්‍යාංශ / රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක් ද සහිතව නොපමාව මෙම දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

4. භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් අනෙකුත් විධි විධාන හා උපදෙස් තවදුරටත් එසේම නොවෙනස්ව පවතී.

එච්.සී.ඩී.එල්. සිල්වා

අධ්‍යක්ෂ ජනරාල්